# 3 පාඩම

## "මිනිස් ජීවිත සන්තෝෂයෙන් ගත කරන්න අපේ ආගම තුළින් ඉගෙන ගන්න විධි අධ්‍යනය කරමු."

**අපි අපේ ආගම තුළින් මිනිස් වටිනාකම් තවත් වැඩි කරමු.**

**පහත කරුණු අපි මේ පාඩමෙන් ඉගෙන ගනිමු.**

- අපේ ක්‍රිස්තියානි ආගම කුමක්ද?
- අවුරුදු 2000 කට පෙර සහ පසු ජේසු තුමාගේ දහමේ වෙනස
- පරණ ගිවිසුම (සමහර දේවල් වලින්) හා අලුත් ගිවිසුම (සම්පූර්ණයෙන්ම) තුළින් අපේ ජීවිතයේ සන්තෝෂයට අවශ්‍යය මූලික මූලධර්ම
- අපි කතෝලිකයෙකු වන්නේ කොහොමද?

## 1. හොඳ අරමුණු අපට කියාදෙන්නේ අපේ ආගමෙන්. මොකද්ද අපේ ආගම?

ඕනෑම හොඳ අරමුණක් අපිට කියාදෙන්නේ අපේ ආගම තුළින්. ලංකාවේ බෞද්ධ, මුස්ලිම්, හින්දු, ක්‍රිස්තියානි සියලු ආගම් වල එන කතුවරයන්ගේ මූලික ඉගැන්වීම් වලින් හොඳ අරමුණවල් අපිට කියා දෙනවා. අපි බලමු අපේ ආගමේ මේ හොඳ අරමුණු සාක්ෂාත් කර ගන්නේ කොහොමද කියලා. ඒවා කොහොමද ඉගෙන ගන්නේ කියලා.

අපේ ආගමේ ප්‍රධාන පොත සුවිශේෂ 4 යි.







ලූක්, මාක්, මතෙව්, ජුවාම්

මේ ආගමෙන් ජේසු තුමාගේ අලුත් පණිවිඩ අපට ඉගෙන ගන්න මේ සුවිශේෂකවරු හතර දෙනා මොනවාද එතුමා කළේ කියලා එක එක කෝණවලින් ලියලා තියෙනවා. ඉතින් අපි ජේසු තුමාට ඉස්සෙල්ලා මොනවාද දෙවියන් කළේ කියලා දැනගන්නත් අපට පුරාණ ගිවිසුමෙන් පුළුවන්.

### පුරාණ ගිවිසුම

අපි මේ පොත් 4 ට ආවේ පුරාණ ගිවිසුමෙන්. ඉතින් අපි පුරාණ ගිවිසුමෙන් ප්‍රධාන කරුණු 4ක් ඉගෙන ගත්තා.

- ✓ අපේ විශ්වාසය
- ✓ අපි ජීවත් වෙන්නේ කොහොමද?
- ✓ අපේ දෙවියන්ට වන්දනා කරන්නේ කොහොමද?
- ✓ අපි දෙවියන් සමඟ සම්බන්ධතා පවත්වන්නේ කොහොමද?

### මගේ ක්‍රිස්තියානි ආගම

ඉතින් ජේසු තුමා අපිට පරණ ගිවිසුමට වඩා අලුත් දේවල්, ජීවිතය සන්තෝෂයෙන් ගෙවන්න ඉගැන්නුවා. පළමුකොට පරණ ගිවිසුමේ තිබුණ ප්‍රධාන කරුණු හතර අලුත් විධියට භාවිතා කරන්න සැලැස්සුවා. ඉස්සර වගේ අපි දැන් සත්තු මරල ලේ ඉහින්න යන්නේ නැහැ. ඉතින් අපි බලමු මොනවද මේ වෙනස්කම් කියලා. අලුත් ගිවිසුමෙන් ඔය කරුණු හතර අපි වැඩිදියුණු කරනවා. ජේසු තුමා ඇවිත් අවුරුදු 60-100 ක් යනකම් කවුරුත් එතුමා කළ දේවල් ලියලා තිබුණේ නැහැ. එතුමා ඇවිත් අවුරුදු 1500ක් යනකම් මේ වගේ මුද්‍රණ තාක්ෂණයක් තිබුනෙත් නෑ. මේ ගැනත් අපි ඔළුවේ තියාගන්න ඕනේ. අපිට අපේ ක්‍රිස්තියානි ආගම ගැන හොඳට දැන ගන්න.

### ජුදා ආගම තවමත් ඊශ්‍රායෙලයේ තියෙනවා. ඒගොල්ලෝ තවමත් පරණ ගිවිසුම විදියට වැඩ කරනවා.

අපි බලමු ජේසු තුමාගෙන් පස්සේ අර ප්‍රධාන කරුණු එහෙමම තියාගෙන අපේ වත් පිළිවෙත් වෙනස් වුණ විධිය. මතක තියා ගන්න ඕනෙ මීට අමතරව තව කරුණුත් ජේසු තුමා අපිට කරන්න කිව්වා. සමහර විට පරණ කතා වෙනස් කර ගන්න කිව්වා. පරණ ගිවිසුමේ තිබුණ "දතට දතක්, ඇහැට ඇහැක්" අලුත් ගිවිසුමෙන් අංශක 180 කින් හැරෙව්වා. ඉතින් අපි මුලින්ම පරණ ගිවිසුමේ තිබුණ ප්‍රධාන කරුණු අලුත් ගිවිසුමේ කරන හැටි බලමු. ඊට පසු වැඩුමනත් කරුණු අවබෝධ කර ගනිමු.

**<u>පුරාණ ගිවිසුම</u>** **<u>නව ගිවිසුම</u>**

අපේ විශ්වාසය



අපි වෙනස් වෙලා



දේව මාළිගාවට ගොස් දෙවියන් සමග සම්බන්ධ වීම

විශ්වාස ලක්ෂණය

අපි කොහොමද දෙවියන්ට වන්දනා කරන්නේ



වෙනස් වෙලා



දෙවියන් අපට කීදේ කිරීම

සක්‍රමේන්තු ලබා ගැනීම

අපි ජීවත් වන්නේ කොහොමද



වෙනසක් වෙලා නෑ



දස පණත

දස පණතට අනුව ජීවත් වීම

අප දෙවියන් සමග සම්බන්ධතාවය පවත්වන්නේ



වෙනස් වෙලා



දෙවියන්ට කන්නලව් කිරීම

ඕනෑම තැනක දෙවියන් සමග සම්බන්ධය පරමණ්ඩලය, දේව මෑණියන්, සාන්තුවරයන් හරහා අප දෙවියන් සමග කතා කරනවා

පරණ සහ අලුත් ගිවිසුම අතර වෙනස

අර පරණ ගිවිසුමේ තිබුණ කරුණු හතරම අලුත් විදියකට අත්දකින්න ජේසු තුමාගෙන් පසු අපේ කතෝලික සභාව සංවිධානය කරලා තියෙනවා. අපේ ජීවිතය සන්තෝෂයෙන් තියා ගන්න. එයින් පරණ දස පණත ඒ විදියටම අප ජීවත් වෙන්නේ කොහොමද කියන එකට අරගෙන තියෙනවා. ඉතිරි තුන අපේ විශ්වාසය, අපි දෙවියන්ට වන්දනා කරන්නේ කොහොමද, අපි දෙවියන් සමග සම්බන්ධතා පවත්වන්නේ කොහොමද කියන එක අලුත් ක්‍රම වලට අර්ථවත් විදියට ජේසු තුමාගේ ජීවිතයේ අත්දැකීම් තුළින් අපි දැන් කරනවා. අපේ විශ්වාසය **විශ්වාස ලක්ෂණයයි.** එහි කරුණු දොළසක් අඩංගුයි. ඒ එක්කම අපි දෙවියන් සමග සම්බන්ධතා පවත්වන්නේ කෙසේද, ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව, මූලික වෙනවා. අපි දේව මෑණියෝ, සාන්තුවරයන් හරහා යාච්ඤා කරන්නේ ඇයි කියන හේතුව අපට කියා දෙනවා. එතකොට අපි දෙවියන්ට වන්දනා කරන්නේ කොහොමද කියන එකට සක්‍රමේන්තු හතක් දී තියෙනවා. මේවා ගැන වැඩි විස්තර දැනගත්තොත් නේද අපි අපේ ආගමේ වැඩිහිටියෙක් වෙන්නේ? ඉතින් අපි ඒවා ප්‍රායෝගිකව කරන විධි ඉගෙන ගම්මු. ඇයි එහෙම කරන්නේ කියලත් කල්පනා කරමු.

## 2. මගේ ජීවිතය

හරියටම මගේ ජීවිතය කාර් එකක් වගේ. කාර් එක එළවන්නෙ මම. ඉදිරි ආසනේ මගේ ගෙදර කට්ටිය ඉන්නවා. පසුපස ආසනේ මගේ යාළුවෝ,නෑදෑයෝ,මා වටා ඉන්න සමාජය ඉන්නවා. මම කාර් එක එළවගෙන යනවා සන්තෝෂය අත්දකින්න. මගේ පාර මගේ කතෝලික ආගමයි. පාරෙන් යන්නේ මගේ සන්තෝෂය අත්දකින්න කියන ගමනාන්තයටයි. කාර් එක මට පදවගෙන යන්න පුළුවන්ද රෝද හතරේ හුලං නැත්නම්? මොනවද මේ රෝද හතර? අපි ඉගෙන ගත්තු

**1.**අපේ විශ්වාසය **2.**අපි කොහොමද දෙවියන්ට වන්දනා කරන්නේ **3.**අපි කොහොමද ජීවත් වෙන්නෙ **4.**අපි කොහොමද දෙවියන් සමග සම්බන්ධතා පවත්වන්නේ

අපි මේවා දන්නෙ නැත්නම් කාර් එකේ හුලං නෑ. කාර් එක දුවන්න ඉස්සෙල්ලා මේ ටයර් හොඳට හුලං ගහලා තියාගන්න අපි ඉගෙන ගත්තොත් හොඳයි නේද?






එක රෝදයක හරි හුලං නැත්තම් ඉදිරියට යන්න බෑ

1. විශ්වාස ලක්ෂණය 2. සක්‍රමේන්තු හත (7)
3. දස පණත 4. පරමණ්ඩලය හා මරිය තුමී හා සාන්තුවරයන් හරහා දෙවියන් එක්ක සම්බන්ධතාව

යන කරුණු පැහැදිලිව දැනගන්න ඕනෙ. නැත්නම් මගේ කාර් එක මගේ කතෝලික සභාව තුළින් මගේ සන්තෝෂය කරා ගෙනියන්න කොහොමටවත් බෑ නේද? කාර් එක කවුරුහරි ලවා තල්ලු කරගෙන යන්නවත් බෑ නේද?

**ජේසු තුමා කව්ද?**

පුරාණ ගිවිසුමේ ලිංගිකත්වය මුල්කරගෙන මිනිසුන් බිහි වුවා. (ආදම් සහ ඒවගේ පටන්) දෙවියන් වහන්සේ මිනිසුන්ට සෘජුව කථා කළා. (අපි දැන් දන්නවා අපිට ජීවිතය ලැබුණේ මව්පියන් හරහා දෙව්මහෝත්තමයාණන්ගෙන් කියලා. ජේසු තුමා දෙව්මව් හරහා ජීවිතය ලැබුවා. ජුසේ තුමා හරියට සාක්ෂිකාරයෙක් වගේ. මේකේ වෙනසක් තියෙනවා නේද? ඒකෙන් අපිට කරුණු දෙකක් ගම්‍ය වෙනවා.)

ජේසු තුමා ආදරය මුල්කරගෙන දෙව්මව් තුළින් මේ ලෝකයට ආවා. ඉතින් එතුමා තුළින් මනුෂ්‍යය ගතිගුණ හා දේව ගතිගුණ දෙකම අපිට දැකගත හැකි වුවා.

## 3.අපි දෙවියන්ට වන්දනා කරන්නේ කොහොමද? සක්‍රමේන්තු 7 (කතෝලික සභාව)

අපි පළමුවෙන්ම සක්‍රමේන්තු හත ගැන අධ්‍යනය කරමු. සක්‍රමේන්තු හත මූලික කොටස් තුනකට බෙදේ.

1)අපි කොහොමද කතෝලිකයෙක් වෙන්නේ?

2)අපි කොහොමද දස පණතේ දී ඇති කරුණු වලට අමතරව ජීවත් විය යුත්තේ?

(මෙහිදී පරණ ගිවිසුමට වඩා අලුත් ගිවිසුමේ අමතර කාරණා, පරණ ගිවිසුමට වඩා ප්‍රතිවිරුද්ධයි)

3)අපි කොහොමද කතෝලික සභාව පරම්පරාවෙන් පරම්පරාවට ගෙනියන්නේ?

අපි අනිත් ක්‍රිස්තියානි ආගම් වල මේ සක්‍රමේන්තු 7 ඒ විධියටම තියෙනවද? නෑ නේද? ඒ ඇයි?

**අපි කොහොමද කතෝලිකයෙකු වන්නේ?**

මුලින්ම ප්‍රසාද ස්නාපනය තුළින් තමයි. අපේ ජන්ම පාපය (අපේ පෙර පව්) අපි ඉපදුණු හැටියෙම අපි අයින් කර දෙවියන් සමග පක්ෂපාත බව,උන්වහන්සේ වන්දනා කරන බව අපි මේ ලෝකයට ආපු ගමන්ම පෙන්වනවා. අපේ ඥාන මව්පියන් අපි වෙනුවෙන් ඒ වගකීම ගන්නවා. ඉතින් අපි අපේ ඥාන මව්පියන්ට ආදරේ වෙන්න ඕනෙ නේද? ඒගොල්ලො අපි වෙනුවෙන් දෙවියන්ට පොරොන්දු වෙනවා අපි ලොකු වුණාම අපේ ජීවිතය දෙවියන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසයෙන් ගත කරන බවට. අපි පළමු පාඩමෙන් ඉගෙන ගත්තා අපිව මේ ලෝකෙට එවන්න තීරණය කෙරුවේ දෙවියන් මිසක් අපේ දෙමව්පියන් නෙමේ කියලා. ඉතින් එහෙම තත්වයකදී අපේ ඥාන මව්පියන්, දෙමව්පියන් අපි ගැන ලොකු පොරොන්දුවක් දෙවියන්ට දීලා තියෙනවා නේද? ඒක නිසා අපි ඒගොල්ලන්ට ගරු කරමු. හැබැයි වන්දනා නොකරමු. මොකද අපි ඉපදුණු ගමන් ප්‍රසාද ස්නාපනය දෙන්නේ. හොඳට තේරෙන වයස එනකම් ඉන්නේ නැතුව. අපේ කතෝලික ආගම අවුල් සහගත වැඩද කරන්නේ? අපි ජීවත් වෙද්දී අපට ක්‍රම දෙකකට ජීවත් වෙන්න පුළුවන්. පළමු ක්‍රමය අපට ජීවිතය දුන් දෙවියන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබා උන්වහන්සේ ජේසු තුමා මගින් අපිට දුන් මුලධර්ම තුළ ජීවත් වීම. අනිත් ක්‍රමය තමයි අපේ බුද්ධිය දියුණුයි කියල හිතලා මට හොඳයි කියලා හිතෙන දේ කිරීම. මේ දෙවෙනි ක්‍රමය සම්පූර්ණයෙන් පළමු ක්‍රමයට පටහැනියි, විරුද්ධයි නේද? අපි දෙවියන්ට වන්දනා කරනවා නම් උන්වහන්සේ අපිව මේ ලෝකයට එව්වයි කියලා දන්නවනම් අපි උන්වහන්සේ ගැන විශ්වාසය තියලා ජීවිතයේ සන්තෝෂය අත්දකින්න පුරුදු වෙන්න ඕනේ. ඒක හින්දයි අපි ඉපදුන ගමන්ම අපි පොරොන්දු වෙන්නේ උන්වහන්සේට වන්දනා කරන්න. උන්වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තියන්න. අපේ පෙර පව් උන්වහන්සේට විතරක් සෝදන්න පුළුවන් කියන්න. එහෙම කරපු කෙනෙක් කරදරයක් ආවාම ශාස්ත්‍රයක් බැලුවොත්, හොඳම වෙලාව බැලුවොත් අපි දෙවියන් කෙරෙහි තියෙන විශ්වාසය පළුදු වෙනවා නේද?අපේ ඥාන මව්පියන්,අපේ දෙමව්පියන්,අපිව බිළිඳු කාලේම ප්‍රසාද ස්නාපනය දුන් මොහොතේ වුණ පොරොන්දුව කඩ කරලා ඒ අයවත් අමාරුවේ දානවා නේද?

**ඊළගට කතෝලිකයෙකු වීමට අවශ්‍යය මූලික කරුණ වන්නේ දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමයි.**

අපි මේ ලෝකෙට ආවේ දෙවියන්ගේ තීරණයට. ඉතින් අපි එතුමාගෙන් අපිට ශක්තිය, ධෛර්යය හැමදාම ලබා ගන්න ඕනෙ. ඔබට හොඳට දුවන්න පුළුවන්. හොඳට දුවන්න නම් ඇගට ශක්තිය ඕනේ. ඇගේ ශක්තිය ඕනෙ කියලා පෝෂ්‍යදායක ආහාර මගේ කකුලේ බැඳගෙන හිටියොත් මට ශක්තිය ලැබේද? නෑ නේද? මම ඒ පෝෂ්‍යදායක ආහාර උයලා, රස කරලා කෑමට ගන්න ඕනේ. එතකොටයි මට ශක්තිය ලැබෙන්නේ. ඉතින් ඒ වගේ තමා දිව්‍ය සත්ප්‍රසාදය. අපේ දිව්‍ය පූජාව වේලාවේදී සත්ප්‍රසාදය වැඩමවද්දී දෙවියන් ඒ පූපයට වඩින බව අපි විශ්වාස කරනවා. ශුද්ධවූ කැතරින් ලැබොරේ සාන්තුවරිය 1883 දී එහෙම දිව්‍ය සත්ප්‍රසාදයට දෙවියන් එන බව හොඳටම දුටුවා. අදත් ඇගේ ශරීරය නොදිරා ප්‍රංශයේ පැරිස් නුවර රියු ඩි බැක් (RUE DE BAC) පල්ලියේ තියෙනවා නේද?



කැතරින් ලැබොරේ සාන්තුවරියගේ නොදිරන ශරීරය



දිව්‍ය සත්ප්‍රසාදයට දෙවියන් වැඩම කිරීම



ඉතින් අපිට තවත් සාක්ෂි ඕනද දෙවියන් වහන්සේ මේ ප්‍රපෙට වඩින බවට. එතකොට අපි හොඳ ජීවිතයක් ගත කර දෙවියන්ගෙන් ශක්තිය ගන්න නම් හැමදාම හෝ හැකි පමණ දිව්‍ය සත්ප්‍රසාදය අපේ ශරීරයට ජීර්ණය කර ශක්තිය ලබා ගත යුතුයි. මේක කතෝලික ආගමේ තිබෙන ප්‍රධාන ශක්තිජනක දිව්‍ය භෝජනයයි.

අපි මිදියුෂ භාවිතා කරන්නේ විගහට කෑම දිරවන්නයි. හැබැයි වැඩියෙන් මිදියුෂ භාවිතා කරන්න හොඳ නැහැ. අපි විශ්වාස කරනවා මේ මිදියුෂ දිව්‍ය පූජාව තුළින් ජේසු තුමාගේ ලේ බවට පරිවර්තනය වෙනවා කියලා. අපට හොඳටම අසනීප වුණාම අපට වෙනත් අයගේ ලේ දෙනවා. ඉතින් අපි කොයිතරම් වාසනාවන්තද දිව්‍ය පූජාව තුළින් ජේසු තුමාගේ ලේ අපිට අපේ ශරීරයට ජීර්ණය කරන්න පුළුවන් වීම ගැන අපට සන්තෝෂයෙන් ජීවත් වෙන්න.

කතෝලික සභාවේ සාමාජිකත්වය ලැබීමට අවශ්‍යය අන්තිම සුදුසුකම තමයි අභිෂේක ආලේපනය. බලන්න අපි ඉපදුනාම පොඩි කාලේ අපි එකපාරට දිව්වේ නැහැ. අපි ඉඳගන්න බලනවා. හිට ගන්න බලනවා. වැටි වැටි නැගිටින්න බලනවා. ඊට පස්සේ තමයි අපි දුවන්නේ. අභිෂේක ආලේපනය කියන්නේ හරියට අපිට කතෝලික සභාවේ දුවන්න පුළුවන් වෙනවා වගේ. කතෝලික සභාවේ මූලික ඉගැන්වීම් අපි දැනගෙන අපේ යාළුවන්ට, මිතුරන්ට අපේ දහම තුළින් අපි ලබන සතුට කියාදෙන්න අපිට පුළුවන් වෙනවා. අපි මේ පාඩම තුළින් කතෝලික සභාවේ ක්‍රියාකාරී වැඩිහිටියෙකු වෙන්න උත්සහ කරමු. ඉතින් ඔබ කතෝලිකයෙකු කියන්න කිසිම සහතික පත්‍රයක් ඕනෑ නෑ. මේ සක්‍රමේන්තු තුන ලබා ගතහොත් ඔබගේ කතෝලික කම කාටවත් නැති කරන්න බෑ. ඔබම තීරණය කරගතහොත් එය නැති කරගන්න මිසක්.

**4.කතෝලික සභාවේ පැවැත්ම**

අපි දන්නවා කතෝලික සභාව එක පරම්පරාවකින් නවතින ආගමක් නෙවේ කියලා. දැනටමත් අවුරුදු 2000 කට වැඩි කාලයක් මේ සභාව තියෙනවා. කොහොමද මේකේ පැවැත්ම තියෙන්නේ? ඔබ ලෝකයේ කුඩාම රාජ්‍යය වතිකානුව ගැන දන්නවාද? ලෝකයේ තියෙන හොඳම පරිපාලනය කතෝලික සභාව සතු බව ඔබ දන්නවාද? ඒ ඇයි?

ආශිර්වාදකාර බන්ධනය තුළින් අපි කතෝලික සභාව පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යනවා. ඒක හින්දා තමයි සමහර ක්‍රිස්තියානි ආගම් වගේ නොවී අපේ ආගමේ ආශිර්වාදකාර බන්ධනය පිරිමියෙකුට හා ගැහැණියෙකුට පමණක් දෙන්නේ.

පූජාත්වරය ලැබිය හැක්කේ ප්‍රසාද ස්නාපනය ලැබූ පිරිමියෙකුට පමණයි. වතිකානුව මගින් පූජාත්වරය හරහා අපි අපේ කතෝලික සභාවේ පැවැත්ම දිගටම ගෙන යනවා. මොකද ගෑණු කෙනෙකුට කතෝලික සභාවේ පූජාත්වරය දෙන්නේ නෑත්තේ? වැරදියි නේද? අනිත් ක්‍රිස්තියානි සභාවල සමතැන දෙනවා. දේව මවට අපි සලකනවා. හිතලා බලන්න ඇයි කතෝලික සභාවේ පිරිමි කෙනෙකුට පමණක් පූජාත්වරය දෙන්නේ කියලා?

**5.දෙවියන්ට වන්දනා කරන්න අප කළ යුතු ප්‍රධාන දේ.**

**5.1 පාපොච්චාරණය/සමාව දීම (Contession/ Reconcilliation)**

අපි අනිත් අය වැරදියි කියලා අපිට සාපේක්ෂව තීරණය කරනවා. හැබැයි කව්ද හරි කියලා මම දන්නේ නෑ හරියට. බලන්න හිට්ලර්ට වුණේ ඒක නේද? ඉතින් අපේ ප්‍රධාන සක්‍රමේන්තුව තමා සමාව දීම නැතිනම් පාපොච්චාරණය.

**5.2 රෝගීන්ගේ ආලේපනය.**

ජීවත් වෙද්දී අපට වරදිනවා. අසනීප වෙනවා. ඒ වෙලාවල් වලදී කතෝලික සභාවෙන් පාපොච්චාරණය එක සක්‍රමේන්තුවක් හැටියට තමයි අපි දෙන්නේ. රෝගීන් ආලේපනය තව සක්‍රමේන්තුවක් හැටියට ලබා දෙනවා. මේ කරුණු වලදී දිව්‍ය ෂත්ප්‍රසාදයට තිරිඟු පිටි භාවිතා කරනවා. රෝගීන් ආලේපනයට ඔලිව් තෙල් පමණක්ද කතෝලික සභාව භාවිතා කරනවා. ඇයි ඒ පොල්තෙල් හා හාල්පිටි පාවිච්චි කරන්න බැරි මේවාට?

ඉතින් අපි මේ සක්‍රමේන්තු හත තුළ අපේ ජීවිතයේ කතෝලිකයෙකු වීමට අවශ්‍යය මූලික අංක හතරෙන් එකක් වන දෙවියන්ට වන්දනා කිරීම කරනවා. එයින් අපි කරන්නේ අපිව මේ ලෝකෙට එව්ව දෙවියන්ට වන්දනා කිරීමයි. කෘතගුණ සැළකීමයි.

පුරාණ ගිවිසුම අනුව අපි දෙවියන් සමඟ ඍජුව කථා කරන්න දේව මාලිගාවට යන්න ඕන. ගිවිසුම් පෙට්ටිය Arc of Cokonent හරහා අපි දෙවියන් එක්ක සම්බන්ධ වුණා. මේ දේව කරඬුවට ලඟා වෙන්න අපි ශුද්ධ විය යුතුයි. එක හේවායෙක් අපිරිසිදුව මේ කරඬුවට ගරු කරන්න ගිහිල්ලා එහෙමම මැරුණා. අංගවිකල අයට මේ කරඬුවට යන්න දුන්නේ නෑ. ඉතින් මේ දෙවියන් ලඟට යන්න පුරාණ ගිවිසුම කාලේදී අමාරුයි. ඇයි? සමහර අය ඒගොල්ලන්ගෙන් වැරදි හින්දා අපිරිසිදුයි කියලා හිතුවා. සමහර අය ඒගොල්ලන්ගේ ජාතිය, කුලය හොඳ නෑ කියලා ගියේ නෑ. ගැහැණු උදවියට මාසයට සැරයක් ඒ කරඬුව ලඟට යන්න බෑ. අපිරිසිදුයි කියලා හිතුවා. ඌරු මස් කෑවොත් ඒ කරඬුව ලඟට යන්න බැහැ. කොටින්ම කිව්වොත් බොහෝම සුලු පිරිසකට තමයි ඒ කරඬුව ලඟට යන්න පුළුවන් වුණේ. ඉතින් පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේව මිනිස්සු දැක්කේ ඒ අයගේ පිරිසිදුකම තුළ සාමාන්‍ය මිනිසෙකුට ලඟා වෙන්න බැහැයි කියලා. ඒ වගේම දෙවියන් අපිරිසිදු අයට දඬුවම් කරන, ඒ අය ගැන නොඉවසන කෙනෙක් හැටියටයි පුරාණ ගිවිසුමෙන් දෙවියන් ගැන ගම්‍ය වුණේ. ඉතින් පුරාණ ගිවිසුම තුළ අපට ඉගැන්නුවේ කොහොමද අපි හොඳටම පිරිසිදු වෙන්නේ දෙවියන් ඉස්සරහට යන්න කියලා. ජේසු තුමා තුළ මේ ඉගැන්වීම සමහර විට කනපිට පෙරලුනා. ඒ කිව්වේ එතුමා දෙවියන් වහන්සේගේ පුතා කියලා. එතුමා ආසරේ කෙරුවේ පව්කාරයන්ව, අංගවිකල අයව. ඉතින් ඒ කාලේ හිටපු ජුදෙව් සමාජයට ජේසු තුමා කියපු පණිවිඩයට හොඳටම 'කොචොප්'වුණා. මොකද කියන්නේ දෙවියන් වහන්සේ හරි වැඩ නේද කරන්නේ? ජේසු තුමාට ඉස්සර තිබුන ක්‍රමය හොඳටම කනපිට හරෝලා පව්කාර මිනිස්සුන්ට පල්ලියට යන්න සැලැස්සුවා. ඒඅ යට ඒ අයගේ පව් මේ ජීවිතයේදීම කමා කරගෙන මේ ජීවිතය හා එන ජීවිතය සන්තෝෂයෙන් ගත කරන විදිය කියා දුන්නා. ඉතින් අපි කරුණු හිත තුළ තියාගෙන තමයි අපි අපේ විශ්වාස ලක්ෂණය තුළ දෙවියන් වහන්සේගේ අලුත් ක්‍රමවේද අපේ

ජීවිතවලට ගම්‍ය කරගන්න බලන්නේ. ඉතින් අපි අපේ ආගම තුළින් විශ්වාස කරනවා. කොයි තරම් අපි පව් කළත් අපිට දෙවියන් වහන්සේ ලඟට යන්න පුලුවන්. පරණ ගිවිසුම වගේ නොවේ. අපිරිසිදුයි කියලා තිබෙන දෙයකින් දෙවියන් ලඟට යන්න අපිට බාධාවක් නෑ. එතුමා ලඟට ගියොත් එතුමා කියා දෙනවා කොහොමද අපි මේ අපිරිසිදුකම නැත්නම් පාපය හලාගෙන මේ ජීවිතයේදීම ජොලියෙන් ඉන්න ක්‍රමය. ඉතින් අපි මේ අභිවෘද්ධි ආලේපය තුළ ඒ කතෝලික දහම දැනගන්න බලනවා. ඒවා ප්‍රායෝගිකව කර ජීවිතය සන්තෝෂය අත්දකින්න බලනවා.

**6. මේ ලෝකයේ පවතිනතාක් අපි කොහොමද දෙවියන්ට වන්දනා කරන්නේ කතෝලිකයෙකු හැටියට.**

| ප්‍රධාන කොටස | | කතෝලික පිලිවෙත් | මොකක් සඳහාද? | මොකටද මේ? | අපේ තියෙන සම්බන්ධතාවය |
|---|---|---|---|---|---|
| ( ක්‍රිස්තියානිකාරයකු වීම | 1 | ප්‍රසාද ස්නාපනය | සභාවේ මූලික සමාජික වීම | අපේ පරණ ජම්ම පාපය නැති කිරීම | හරියටම අපි ඉපදුනා වගේ අපේ ආගමට |
| | 2 | දිව්‍ය සත්ප්‍රසාදය | ජේසුතුමාව අපේ ජීවිතයට පීජනය කිරීම | හරියට අපි හැමදාම කෑම කනවා/ජීවත්වෙන්න | කෑම නොකෑවොත් අපි මැරෙනවා |
| | 3 | අභිවෘද්ධි ආලේපය | සභාවේ පූර්ණ සමාජිකයකු වීම | හරියටම ඉපදුනාට පස්සේ දුවන්න පුලුවන් වගේ | අපි දෙවියන්ව අත්දැක ජීවිතය සතුටින් ගත කිරීම |
| ක්‍රිස්තියානිකාරයකු සන්තෝෂයෙන් ජීවිතය ගත කළ යුතු අවශ්‍ය කරණයන් | 4 | රෝගින්ගේ ආලේපය | තමාට ශාරීරික ආබාධියකද පියතුමකු මගින් සැනසීම ලබා ගැනීම | ජේසුතුමාට සියල්ල කළ හැකි බව ප්‍රායෝගිකව අත්දැකීම | ජීවත් වෙද්දී අපි අතර ප්‍රායෝගික සම්බන්ධතාවය දෙවියන් එක්ක |
| | 5 | පාපුච්චාරණය | තමාගේ වැරදි සිතුවිලි හා වැරදි ක්‍රියාකාරකම් වලට සමාව ලබාගැනීම | තමුන්ගෙන් වෙච්ච වැරදි වලට ප්‍රායෝගිකව සමාව ගැනීම සහ එය නැවත නොකිරීම | ජීවිතයේ සන්තෝෂය අත්දකින්න |
| දේව රාජ්‍ය පැවතීමට අවශ්‍ය දේ | 6 | පූජාත්වරය | දේව රාජ්‍ය සදාකාලික ගොඩනැගීමේ කාර්යය | දේවරාජ්‍ය ගෙනයාමට අවශ්‍ය විශේෂ කර්තව්‍යයන් කිරීම | පියතුමකු ක්‍රියාවලිය අපිට දෙවියන් ලඟට කිට්ටු විය හැක |
| | 7 | ආශිර්වාදකාර බන්ධනය | | දේවරාජ්‍යය ගෙන යාමට සමාජයට අවැසි කටයුතු කිරීම | සමාජය තුළින් දේවරාජ්‍ය දැකීම |









## සිතන්න යමක්

- අනුන්ව විනිශ්වය කරන්න පුරුදු වුණොත් අපේ සත්ව ගතිගුණ අපි නොදැනුවත්වම වැඩි වෙනවාද?
- ඕනෑම ආගමකින් හොඳ පරමාර්ථ දියුණු කරගෙන ජීවිතය සන්තෝෂයෙන් ගෙන යන ක්‍රම කියා දෙනවා. අපේ ආගමෙන් සන්තෝෂය අත්දකින්න බොහෝම සරල ක්‍රම කියා දෙනවා. ඔබත් මේ සරල ක්‍රම මේ පාඩම තුළින් ඉගෙන ගත්තාද?
- අපිට කතෝලිකයෙකු වීමට වත්පිළිවෙත් තුනක් ඇයි?
- කාර් එකක ටයර් හතර හොඳට හුලං තිබුණොත් කාරය පැදවිය හැකිද? තව මොනවද කාර් එකේ එන්ජිමට තිබෙන්න ඕන,කාර් එක පනගන්වා පදවන්න නම්. මේවා එළියට පේන්නේ නෑ නේද?කාර් එකේ යන අයත් දන්නේ නෑ නේද.
- ඔබ දිව්‍ය සත්ප්‍රසාදයට කරන ගෞරවය හොඳද? අනිත් අයට ඊටත් වඩා ගෞරව කරනවාද? එහෙනම් ඔබ කතෝලිකද?
- අසනීපයක් වුණොත් ඔබ බෙහෙත් ගන්නවාද? නැත්නම් යාච්ඤා කර කර විතරක් ඉන්නවාද?නැත්නම් දෙකම කරනවාද? කෝකද හොඳ? ඇයි ඒ?

## ප්‍රශ්න

1 අපි ඉපදුණ ගමන් දෙමව්පියෝ අපිට ප්‍රසාද ස්නාපනය දෙන්නේ ඇයි? වෙනත් ක්‍රිස්තියානි ආගම් වගේ ටිකක් ලොකු වෙලා ප්‍රසාද ස්නාපනය ලැබුවනම් හොඳයි නේද?

2 පුනරුත්පත්තිය හා කර්මය අපේ ජීවිත වලට සම්බන්ධ ද? ඒවා ගැන මම හිතන්න ඕනෙද? අපේ ආගමේ මේවා ගැන වැඩි විස්තර නැත්තේ ඇයි? මේවා හා ප්‍රසාද ස්නාපනය අතර ඇති සම්බන්ධතාවය ලියන්න.

3 ප්‍රසාද ස්නාපනය ලැබූ අයෙක් සාස්තර බැලීම, හොඳම වෙලාව හොයා ගෙන යෑම, හඳහන් බැලීම හොඳද, නරකද? වැඩිමනක් කරුණු විස්තර කර ලියන්න.

4 අභිෂේක ආලේපයේදී ප්‍රසාද ස්නාපන පොරොන්දු ගන්නේ ඇයි? දිව්‍ය සත්ප්‍රසාදයේදී එහෙම කරන්නේ ඇයි? අභිෂේක ආලේපය දෙන්න බිෂොප් කෙනෙක්ම එන්න ඕනෙද?

5 අපේ ක්‍රිස්තියානි ආගම හා පූජා ආගම අතර ඇති වෙනස කුමක්ද?

6 අපි ආගම ඉගෙන ගන්න මුලින්ම කියවිය යුතු පොත කුමක්ද? මේ පොත් කවුද ලියා තියෙන්නේ? ඇයි දෙවියන් වහන්සේ මේ පොත් ලිව්වේ නැත්තේ? ඇයි අද අපිට අපේ ආගම ගැන කරුණු හිත හිතා ඉන්න වෙන්නේ? ඒක හොඳද?

7 අලුත් ගිවිසුමට අනුව දෙවියන්ට වන්දනා කරන්නේ කොහොමද? පරණ ගිවිසුමේදී එය කළේ කොහොමද? ඔබ ඒ වෙනසට ආසද? ඇයි ඒ?

8 පරණ ගිවිසුමේ දෙවියන් සමඟ සම්බන්ධතාවය මිනිසුන් ගොඩ නැගුවේ කොහොමද? අලුත් ගිවිසුමේ එය වෙනස් වෙලාද? දේව මෑණියන්ට, සාන්තුවරයන්ට අපි ගරු කළ යුතුද? ඇයි ඒගොල්ලො හරහා අපි යාච්ඤා කරන්නේ? දෙවියන් වහන්සේ විතරක් හිටියම ඇති නේද?

9 අපේ කතෝලික සභාව ලෝක අවසානය දක්වා පවතින්නේ කෙසේද? මොනාද ඒ සඳහා කතෝලික සභාවෙන් දී ඇති සක්‍රමේන්තු?

10 දෙවියන්ට අපි වන්දනා කරන්න කතෝලික සභාවේ දී ඇති සක්‍රමේන්තු හතෙන් දෙකක් පමණක් ජීවිතය සන්තෝෂයෙන් ගෙනයන්න වැදගත් වේ. ඒ මොනවාද? ඔබ ඒවා පිළිපදිනවාද? සන්තෝෂයක් ලබනවාද?

11 ජේසුතුමාව බලන්න පඬිවරු තාරකා ශාස්ත්‍රය භාවිතා කළා. ඉතින් අපිත් ශාස්ත්‍රයක් බැලුවොත් හොඳයි නේද? නැත්නම් හොඳම වෙලාවක් බලලා දකුණු කකුල ඉස්සරහට තියලා වැඩ පටන් ගමුද? අපි එහෙම කළත් අපේ රට අද දියුණුද?

12 අපි ශෂ්ඨාංගිකව වන්දනා කළ යුත්තේ දිව්‍ය සත්ප්‍රසාදයටද නැත්නම් මව්පියන්ට/ ගුරුවරුන්ටද? වන්දනා හා ගරු කිරීම අපිට පැටලිලාද? ඔබ දිව්‍ය සත්ප්‍රසාදයට වන්දනා කරන විධියෙන් පිට අයට මොකද හිතෙන්නේ? ෂුවර් නෑ වගේද?

13 අපේ අලුත් කාර් එක ගැන විස්තර ලියන්න. කාර් එක, පාර, කොහෙද යන්නේ, කාර් එක පදවන්න තව වැඩිපුර දේවල් ගැන දැන ගන්න ඕනෙද?

14 අභිෂේක ආලේපය කියන්නේ මේ පාරේ කාර් එක පදවන්න ඔබට දෙන බලපත්‍රයද? කාර් බලපත්‍රයක් ගන්න මාර්ග නීති දැන ගත්තට විතරක් මදි නේද? පදවලා පෙන්වන්න ඕනෙද? කොහොමද ඔබ ඔබේ ආගමේ එහෙම බලපත්‍රයක් ගන්නේ?